# 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය - 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ - 07

## (01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

### 1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර:

### (අ). ආයතනයේ දැක්ම:

දැනුම සහ ආස්වාදයෙන් පරිපූර්ණ අර්ථවත් කෞතුකාගාර සේවාවක් මහජනතාව වෙත ලබා දීම.

### (ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික සහ ස්වභාවික උරුමය පිළිබිඹු කෙරෙන කෞතුක භාණ්ඩ සහ නිදර්ශක අත්පත් කරගැනීම, එක්රැස් කිරීම, විධිමත්ව ලේඛණගත කිරීම, විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සහ එම එකතූන් සහ දැනුම පර්යේෂණ , අධ්‍යයන, අධ්‍යාපන අරමුණු සහ රසාස්වාදය උදෙසා ඵලදායී ලෙසත් ආකර්ශනීය ලෙසත් මහජනතාව වෙත සම්ප්‍රේෂණය කරීම.

## 1.3. කාර්යභාරය

- පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කෞතුක භාණ්ඩ සහ නිදර්ශක රැස් කිරීම,ලේඛනගත කිරීම සහ ආරක්ෂා කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු කෞතුකාගාර එකොළහක ස්ථිර ප්‍රදර්ශන යාවත්කාලීනව පවත්වා ගැනීම, ආරක්ෂාව තහවුරු කිරීම සහ දෛනික නඩත්තු සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.
- සංරක්ෂිත පැරණිතම ග්‍රන්ථ සහ පුස්කොළපොත් එකතුවක් සහිත ජාතික කෞතුකාගාර පුස්තකාලය මගින් පර්යේෂකයන් සඳහා ඵලදායී විමර්ශන සේවාවක් ලබාදීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ස්පෝලියා සෙලනිකා නැමති පර්යේෂණ සංග්‍රහය, කෞතුකාගාර එකතූන්ට අදාළ පර්යේෂණ සහ නාමාවලි, දෙපාර්තමේන්තු ප්‍රකාශන ලෙස මුද්‍රණය වී තිබෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.
- උක්ත විෂය ක්ෂෙත්‍රයන්ට අදාළව දැනුම වර්ධනය කිරීම සඳහා දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහිත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල විද්‍යාර්ථීන් සඳහා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම සඳහා සම්පත් දායක ආයතනය ලෙස කටයුතු කිරීම.
- නීතිමය කටයුතු සඳහා සත්ත්ව ආදර්ශක හඳුනාගැනීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.
- බාහිර ආයතන විසින් කෞතුකාගාර ස්ථාපනය කිරීමේදී උපදේශන සේවා ලබාදීම.
- ආකර්ෂණීය කෞතුකාගාර සේවාවක් ලබාදීම තුළින් දෙස් විදෙස් කෞතුකාගාර නරඹන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් ජාතික ආදායමට දායකත්වයක් ලබාදීම.

## 1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

### (අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය
- මානව විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

- සංරක්ෂණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඡායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

### (ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාරඃ

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය - කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව
- ජන කෞතුකාගාරය - අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය - ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය - කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය - පොළොන්නරුව

## (02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

### ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

### (අ). ජයග්‍රහණ:

- කොළඹ ජාතික කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ සිතුවම් නැවත පිටපත් කිරීමේ ව්‍යාපෘතියට අදාළව පිටපත් කිරීමට නියමිතව තිබූ ඉතිරි සිතුවම් 10ද, පිටපත් කර එම ව්‍යාපෘතිය අවසන් කිරීම.
- සත්ත්ව විද්‍යා රසායනාගාරය නවීකරණය කිරීම.
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය නවීකරණය කිරීම.
- භූ විද්‍යා අංශයේ ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම.
- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ මත්ස්‍ය, උභය ජීවී හා උරග මැදිරි නවීකරණය කිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු හා ප්‍රදර්ශන නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව නිමකිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාර උද්‍යානය ජෛව විවිධත්ව උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම.
- මහනුවර ජාතික කෞතුකාගාර උද්‍යානය අලංකාරණය කිරීමේ ව්‍යාපෘතිය නිමකිරීම.
- ගාල්ල ජාතික කෞතුකාගාර නවීකරණ කටයුතු සිදුකිරීම.
- ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.

### (ආ). අභියෝග හා ඉදිරි ඉලක්ක:

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ආකර්ෂණීය ලෙස වැඩි දියුණු කිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රය තුළ කාබනික ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සිදුකිරීම.
- ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ උද්‍යානය නවීකරණය කිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාරයේ ගෘහභාණ්ඩ මැදිරිය නවීකරණය කිරීම.
- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල යටතේ ලබන වසරේ දී පහත සඳහන් ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වේ.
  - (01.) මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි
  - (02.) ශ්‍රී ලංකාවේ මිල මුදල් - ලීලානන්ද කල්දේරා
  - (03.) ශ්‍රී ලංකාවේ ලෝකඩ මූර්ති කලා උරුමය
  - (04.) The Heritage of Sri Lankan Bronze Culture
- Spolia Zeylanica (Vol.-50) පර්යේෂණ ග්‍රන්ථය එළිදැක්වීම.
- A Guide to The National Museum Colombo ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය මුද්‍රණය කිරීම.
- පෞරාණික වටිනාකමකින් යුත් ඕලන්ද කෞතුකාගාරයේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම හා ප්‍රදර්ශන මැදිරි නවීකරණය කිරීම. (රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අදාළ කාලය තුළ නිමකිරීමට අපොහොසත් වීම හේතුවෙන් 2021 ජූනි මස වන විට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතයි.)

- ගාල්ල ජාතික කෞතුකාගාරයේ මැදිරි නවීකරණය හා සංරක්ෂණ කටයුතු සිදුකිරීම.
- මහනුවර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- ඕලන්ද කෞතුකාගාරයේ සංවර්ධන කටයුතු සිදුකිරීම.



සනූජා කස්තූරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | 84,730,339 | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | 84,730,339 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 250,660,000 | 289,719,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 5,057,080 | 6,398,168 | ඒසීඒ-4 |
| 3,500,000 | අත්තිකාරම් ගිණුම් | | 11,165,177 | 11,395,444 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 35,226,740 | - | |
| **3,500,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **302,108,996** | **307,512,612** | |
| **3,500,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **302,108,996** | **392,242,951** | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 183,250,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 177,317,781 | 167,205,110 | ඒසීඒ-2(ii) |
| 55,480,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 46,398,990 | 41,837,833 | ඒසීඒ-2(ii) |
| 1,750,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,542,400 | 1,539,979 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | 234,333 | ඒසීඒ-2(ii) |
| **240,480,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **225,259,171** | **210,817,256** | |
| | මූලධන වියදම් | | | | |
| 34,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 33,047,727 | 59,313,263 | ඒසීඒ-2(ii) |
| 44,050,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 13,771,440 | 5,823,798 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 100,000 | හැකියා වර්ධනය | 14 | - | 1,056,250 | ඒසීඒ-2(ii) |
| 20,820,000 | වෙනත් මූලධන වියදම් | 15 | 20,318,758 | 92,839,085 | ඒසීඒ-2(ii) |
| **98,970,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **67,137,924** | **159,032,396** | |
| **600,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **6,404,427** | **22,022,868** | |
| | තැන්පතු ගෙවීම් | | 4,686,164 | 3,431,344 | ඒසීඒ-4 |
| 600,000 | අත්තිකාරම් ගෙවීම් | | 1,718,262 | 18,591,524 | ඒසීඒ-5 |
| **340,050,000** | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **298,801,521** | **391,872,520** | |
| **(336,550,000)** | 20220 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | **3,307,475** | **370,431** | |

# 2020 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 10,880,336,787 | 10,834,969,981 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 36,833,118 | 46,280,033 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | 370,431 |
| **මුළු වත්කම්** | | **10,917,169,905** | **10,881,620,445** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 23,247,181 | 33,697,060 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 10,880,336,787 | 10,834,969,981 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 12,953,489 | 12,582,973 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | 632,448 | 370,431 |
| **මුළු වගකීම්** | | **10,917,169,905** | **10,881,620,445** |

පිටු අංක 05 සිට 60 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 61 සිට 75 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2021/02/19 |
| දිනය : | දිනය : 2021. 02. 17 | |

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, "දහම්පාය",
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

සනුජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

ඩබ්ලිව්. එෆ්. ඩී. පී. ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන 2020 රු. | 2019 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | 75,297,800 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | 689,981 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 26,752,819 | - |
| අග්‍රිම ලැබීම් | 250,660,000 | 289,719,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **277,412,819** | **365,706,781** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 207,338,431 | 258,449,706 |
| සහනාධාර සහ මාරුකිරීම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,057,090 | 83,570,083 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 632,448 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **211,027,969** | **342,019,789** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **66,384,850** | **23,686,992** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | 103,500 |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 2,515,303 | 1,573,966 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **2,515,303** | **1,677,466** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 65,067,831 | 5,823,798 |
| අත්තිකාරම් ගෙවීම් | 764,000 | 18,591,524 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **65,831,831** | **24,415,322** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(63,316,528)** | **(22,737,856)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **3,068,322** | **949,136** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 1,332,058 | 2,075,852 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **1,332,058** | **2,075,852** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 4,400,379 | 3,024,989 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **4,400,379** | **3,024,989** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(3,068,322)** | **(949,137)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

### 3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

### 3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.01.01 | ගොඩනැගිලි කුලී | | | 3,117,330.62 | - |
| 20.03.99.00 | අනෙකුත් ආදායම් | 59,450,000 | 59,450,000 | 23,315,859.87 | 39.2% |
| 20.02.02.99 | ණය පොලිය | 1,630,000 | 1,630,000 | 1,427,607.90 | 87.58% |

### 3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 243,550,000 | 240,480,000 | 225,127,231 | 93.6% |
| ප්‍රාග්ධන | 95,900,000 | 98,970,000 | 67,139,924 | 67.8% |

### 3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 01 | ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලාශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | දඹාන ජන උරුම කේන්ද්‍රය තුළ ඉපැරණි ආදිවාසී අස්ථි ප්‍රදර්ශනයක් සකස් කිරීම. | 850,000 | 850,000 | 850,000 | 100% |

### 3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

**රු. ,000**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 800,000 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 77,967 | | |
| 9153 | ඉඩම් | | 10,002,369 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරෙමින් පවතින වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

### 3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } CAS/C/NM/04/2020/FA    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2021 මැයි 03 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත සම්පිණ්ඩන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.ජී.සරත්

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එවා ඇත.

2. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී, [illegible] බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } CAS/C/NM/04/2020/FA   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2021 මැයි 03 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 03 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1. ආදායම් නොවන ලැබීම්

2019 ජූලි 30 දින සේවය අතහැර ගිය සේවකයෙකුගේ 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ ණය ශේෂය රු.50,741 ක් විය. සේවය අතහැර ගිය එම සේවක ණය ශේෂය 2020 ර.නි.අ "බී" ගිණුමට අදාළ සැසඳුම් ප්‍රකාශය තුළ ස්ථාන මාරු වී ගිය සේවක ණය ශේෂයක් ලෙස සටහන් කර තිබුණි.

1.6.1.2. පුනරාවර්තන වියදම්

208-02-02-1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් වැය විෂයයෙහි සංශෝධිත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 78 ක ඉතිරි කිරීම් කර තිබුණි.

1.6.1.3. මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන වෙනුවෙන් වූ මූලධන වැය ශුද්ධ ප්‍රතිපාදනය රු.98,770,000 ක් වූ අතර, එහි සත්‍ය වියදම රු.67,137,924 ක් විය. ඒ අනුව සලසාගෙන තිබූ ප්‍රතිපාදනය කාර්යක්ෂමව භාවිතා නොකිරීම නිසා 208 – 01 සහ

208 – 02 වැඩසටහන් සඳහා සලසාගෙන තිබූ මූලධන ප්‍රතිපාදනයන්ගෙන් පිළිවෙලින් සියයට 42 ක් සහ සියයට 32 ක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි.

(ආ) 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයයවල ඉතිරිවීම් සඳහා (ඒසීඒ-2(ii)) හේතු දැක්වීම් යටතේ අංක 04/2019 සහ අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛ සටහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූලධන ඉතිරිවීම් සඳහා උක්ත චක්‍රලේඛ අදාල කර ගත නොහැකි බව නිරීක්ෂණය විය.

1.6.2. **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1.6.2.1. **මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවා ඇති හෙක්ටයාර් 4.6317 ක ඉඩම සහ අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර 07 ක් පිහිටුවා තිබූ ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට විවිධ රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කරගෙන තිබුණද,2021 මාර්තු වන විටත් එම ඉඩම් පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර තුළ ප්‍රදර්ශනය සඳහා පවතින කෞතුක භාණ්ඩ භෞතික සමීක්ෂණයක් සිදු කර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම භාණ්ඩ 2018 වර්ෂයෙන් පසුව සමීක්ෂණය කර එම අවසන් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2.2. **මූල්‍ය වත්කම්**

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් වල මුදල් හා මුදල් සමාන දෑ යටතේ අග්‍රිම ශේෂය වූ රු.632,448 ක අගය සටහන් නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් ශුද්ධ වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 1.6.3. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෞතුකාගාර දෙපාර්තමේන්තුව, රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් භාවිතා කර , 2016 දෙසැම්බර් 31 දින එකතුව රු. 1,856,987 ක් වටිනා චෙක්පතක් පෞද්ගලික ආයතනයක් වෙත නිකුත්කර තිබුණි. මෙම චෙක්පත නිකුත් කර මාස 14 ක දීර්ඝ කාල ප්‍රමාදයකට පසුව 2018 මාර්තු 02 දින උපලබ්ධි වී තිබුණි.චෙක්පත දීර්ඝකාල ප්‍රමාදයකට පසුව උපලබ්ධි වීම පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලිඛිත පැහැදිලි කිරීම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ආ) මුදල් රෙගුලාසි 762 ප්‍රකාරව අවශ්‍ය තොග මට්ටම් පවත්වා ගැනීමට අවශ්‍ය භාණ්ඩ පමණක් තොග ලෙස තබා ගැනීමටත්, පමණට වඩා අධික තොග තබා නොගැනීමටත් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වුවත්, ටෝනර්, ෆැක්ස් රෝල් සහ ප්‍රින්ටර් මාස්ටරෝල් ඇතුළු භාණ්ඩ වර්ග 04 ක් භාවිතයට ගැනීමකින් තොරව ගබඩා කර පැවති අතර, ඒවා මිලදීගත් දින සහ වටිනාකම් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

## 1.6.4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර 11 වැනි පරිශිෂ්ඨය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ii) ඇප ලේඛනය | මු.රෙ.891(1) | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මු.රෙ.454(2) | පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළට අන්තර්ගත විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 04 | දෙපාර්තමේන්තුවේ ර.නි.අ."බී"ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී ණය සහ ණය අත්තිකාරම් පිළිබඳව වන ණයගැති ලේඛන සහ ණයහිමි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.3. අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31දින දක්වා වර්ෂ 10 ක කාල සීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව, එම බදු කාල සීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද මණ්ඩලය කටයුතු කර තිබුණි. එසේම
එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අය විය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.66,194,051 ක් විය. මෙම හිඟ ආදායම් අය කර ගැනීමටත් දෙපාර්තමේන්තුව සතු වත්කම් කළමනාකරණය කර ආරක්ෂා කර ගැනීමටත්, මෙම අවිධිමත් ගණුදෙනුව නිරවුල් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

## 2.4. බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නමුත්, ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ට වැඩි කල් ඉකුත් වූ එකතු වටිනාකම රු.354,314 ක් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

# 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

2020 වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමේදී සමස්ථ පිරිවැය ඒ ඒ කාර්යයන් සඳහා බෙදා වෙන්කර නොතිබීමත්, ඉලක්ක මත ලඟාවීම මැන බැලීමට දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීමත් කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දැක්වෙන සමුච්චිත කාර්යය සාධන වාර්තා ඉදිරිපත් නොකිරීමත් හේතුවෙන් සැලසුම් ඉටු කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 3.1.1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල ජල ටැංකිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බදු රහිත ඇස්තමේන්තුගත වටිනාකම

රු.18,676,148 ක් විය.මෙම ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 26 දින ගිවිසුමට එළඹ තිබූ අතර, 2016 දෙසැම්බර් 26 දින වැඩ නිමකළ යුතුව තිබුණි. ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබූ මෙම ඉදිකිරීම්වල ප්‍රගතිය 2020 වර්ෂය අවසානය වන විටත් සියයට 40 ක් විය.

(ආ) හම්බන්තොට මාගම් රුහුණුපුර උරුම කෞතුකාගාරයේ ශ්‍රවණාගාරය සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.22,509,349 ක ව්‍යාපෘතියකට 2015 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි.2016 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු මිලියන 18.09 ක ගෙවීම් සිදුකර තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ඇ) ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණ සහ අළුත්වැඩියා කිරීම් සඳහා එකතුව රු.97,259,127 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත 2019 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන 2020 මැයි 01 දින වැඩ නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යය සඳහා වන කාලය 2020 දෙසැම්බර් 31 දක්වා පසුව දීර්ඝ කරගෙන තිබුණි. මෙම කාර්යය සඳහා 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.30,001,964 ක් (වැට් සහිත) ගෙවීම් කර තිබූ නමුත්, 2021 මාර්තු වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු නිමකර නොතිබුණි.

(ඈ) ජාතික කෞතුකාගාරයේ සත්ත්ව විද්‍යා අංශයේ උරග උභයජීවී හා මත්ස්‍ය මැදිරිය නවීකරණය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව, එකතුව රු.3,321,300 කට පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත 2019 ඔක්තෝබර් 01 දින පිරිනමා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ පිළිතුරු ප්‍රකාරව 2020 දෙසැම්බර් 15 දින දක්වා දින දීර්ඝ කර තිබූ මෙම නවීකරණ කටයුතු වලට අදාළ කොන්ත්‍රාත්තුව 2021 මාර්තු වන විටත් නිමකළ බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.

### 3.2. ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතනයක් විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව ඊට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

3.3. පාඩු හා හානි

2012 මාර්තු 17 දින සිදු වූ කෞතුක භාණ්ඩ නැතිවීම සම්බන්ධව සකස් කරන ලද ඇස්තමේන්තුවක් අනුව එම භාණ්ඩ වල එකතු වටිනාකම රුපියල් ලක්ෂ 48 ක් පමණ විය. නඩු කටයුතු අවසන් නොවීම නිසා මෙම කෞතුක භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර, ඒ අනුව අස්ථානගත වූ භාණ්ඩ සහ සොයාගත් භාණ්ඩ අතර, භාණ්ඩ ඌනතාවය සහ එහි වටිනාකම් හඳුනා ගැනීමට සහ අවශ්‍ය ගැළපීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක්ද සිදු කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුවේ ර.නි.අ. "බී" ගිණුමට අදාළ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.1,131,500 ක් විය. 2020 අගෝස්තු 28 දින අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 1 (ඉ) ඡේදය ප්‍රකාරව කල් ඉකුත් වූ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2020 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු 47 කට අදාළව පුරප්පාඩු 137 ක් වූ අතර, ඒ අනුව අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අතර සියයට 29 ක සේවක ඌනතාවයක් පැවතුණි. මෙම සේවක ඌනතාවයවය සම්පූර්ණ කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

එච්.ජී. සරත්
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

## 04). කාර්ය සාධන දර්ශක:

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව):

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% -74% |
| සෑම මට්ටමකින්ම වගකිව යුතු හා අපේක්ෂිත සේවා සපයන ආයතන ප්‍රවර්ධනය කිරීම උදෙසා උසස් තත්ත්වයේ ලේඛන එකතුවක් පවත්වාගෙන යාම. | | | **55%** |
